# එලා ද ? බෙලා ද ?



**කෘතියේ නම**

එලා ද ? බෙලා ද ?

**කතෘගේ නම**

සාමන්දී ගම්ලත්

**කතෘගේ වෙනත් කෘති**

සමනලීගේ මල් වත්ත

උඩු යටිකුරු

**කෘතිය පළ කරන ලද දිනය**

2025.02.08

**ISBN -978-624-208-654-5**



# පිදුම

කුඩාකල සිටන් මා ඇති දැඩි කරමින් හෙට
ලොව දිනන්නට නිතිදා

මා හට යෝධ සෙවනැල්ලේ වූ මාගේ
ආදරණීය අම්මා

තුෂානි විජේකුලසූරියට....

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසය කෝට්ටෙ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටෙම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත් කතුවරුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන “භෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වයක් දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසල් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල්ම අවධියේ තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ඔන්න එක දවසක් හවස හැමෝටම ඇහෙන්න කවුරුහරි බැරි හංදිය ළඟ බනින සද්දයක් ආවා. හැබැයි කවුරුත් ඒක ගැන පුදුම වුණේ නෑ. මොකද හැමෝම දන්නවා. ඒ මිස් ග්‍රීන් වැඩ ඇරිලා ආවහම එයාගේ දූව මොකක් හරි නොසන්ඩාල වැඩක් කරලා තියෙන නිසා. ඒකට බනින සද්දේ කියලා මිස් ග්‍රීන්ගෙ ගෙදර පැත්තට ගියොත් එයාගේ දූව මේ පාර කේක් එකක් හදනවා කියලා අවන් එක පුපුරල දාලා. ඊට පස්සේ මිස් ග්‍රීන් හොදටම තරහ අරගෙන එයාගේ දූව වන එලාගේ අතට පෝස්ටරයක් දුන්නා. ඒක අතට ගත්ත ගමන්ම "සමර් කෑම්ප් එකක් මොනවා... " කියලා එලාට ම කියවුණා. ඊළඟට එයාගේ අම්මා "ඔව් හෙට උදේ අටට ඔයා කැමති වුණත් නැතත් ඔයා එහෙ යනවා" කියලා. එයාගේ අම්මා හරිම තරහෙන් උඩට ගියා. ඊට පහුවදා උදේ එලාව හරිම අමාරුවෙන් කාර් එකට නග්ගගෙන එලාගේ අම්මා එයාවත් එක්කගෙන සමර් කෑම්ප් යන්න පිටත් වුනා.




මග දිගට යනකම්ම එලා එයාගේ වැරදි වලට නිදහසට කාරණා කිය කිය ගියේ, "ඔයා දන්නවනේ අම්මා මම බර්ත් ඩේ කේක් එකක් හැදුවෙ ඔයාගේ උපන්දිනයටනේ. එතකොට එහා පැත්තෙ ගෙදර පූසන්ට සිහිය නැති කෙරෙව්වේ මගේ විද්‍යා ව්‍යාපෘතිය හරිද කියල බලන්න. තව ඔයාගේ ඇඳ උඩට ඇසිඩ් හැලුවේ ඒක හරියටම ඇසිඩ් ද කියලා හොයාගන්න.

තව ඉතින් මිස්ටර් ජෝන්ගේ බල්ලගේ නැවටට ගිනි තිබ්බෙ මට එතකොට ගින්දර පත්තු කරන එක ගැන හොඳ පුහුණුවක් ලැබෙන නිසා.” එහෙම කියලා එලා තප්පරයකට නැවත්තුවා. හැබැයි ඉතින් ඒ එයාගේ කතාව ඉවර කරන්න නෙමෙයි. මොකද කියනවනම් ඉතින් මේ විදිහට කියලා නම් එයාගේ නරක වැඩ ටික කියලා ඉවර කරන්න බෑ. එයා විනාඩියකට නැවැත්තුවේ පොඩි හුස්මක් ගන්න. ඔන්න ඉතින් හුස්ම අරන් ඉවර වෙන්නත් කලින්ම එයාගේ අම්මා කතා කරන්න පටන් ගත්තා. “ආ එහෙම එලා එතකොට ඔයා කේක් හැදුවේ මගේ මීට මාස අටකට කලින් තිබ්බ උපන්දිනයටද එතකොට මගේ බොස් ගෙදර ආවහම එයාට ගෙදර තියෙන හැම දහජරාවක්ම දාලා තේ එකක් හදලා දුන්නේ, ඒවගේම අර ඔයාව බලාගන්න ආපු කෙනාට හොල්මන් ෆිල්ම් එකක් පෙන්නලා නූල් බඳින්න වෙච්ච එක ඒවා එහෙම කරන්න ඇත්තෙ මම වෙන්න ඇති නේද? නැත්තං ඔයා වගේ වෙන කවුරුහරි වෙන්න ඇති” ඊට පස්සේ එලාගේ අම්මා විනාඩි පහකට කතාව නවත්තන කොට එලා පටන් ගත්තා. “අම්මා ඔයා කියපු කතාව සම්පූර්ණයෙන්ම වැරදි ඔයා දන්නවද? අපේ ඉතිහාසයට මිස් කියලා දුන්නා ළමයි ඉන්නෙ වැරදි කරන්නලු. එතකොට අම්මලා ඉන්න ඒවට සමාව දෙන්නලු. ” ඉතින් සමර් කෑම්ප් එකට ළඟා වෙනකම්ම එලා ඔය වගේ විකාර කතා එයාගේ අම්මට කිය කියා තමයි ගියේ. ඔන්න ඉතින් අවසානයට එලායි එයාගේ අම්මයි දෙන්නම සමර් කෑම්ප් එකට ලඟා වුණා.



ඊට පස්සේ එලාගේ අම්මා එලාට බහින්න කිව්වහම එලා කාර් එකේ සීට් එක බදාගෙන බහින්න බෑ කිව්වා ඊට පස්සේ ඉතින් එයාගේ අම්මට අන්තිමට උනේ හරිම ලැජ්ජ සහගත විදිහට එලාව පාර දිගේ ඇදගෙන ගිහින් කෑම්ප් එකට බාර දෙන්න.

ඊට පස්සේ එලා ඔලුව නමාගෙන එයා ඊළඟට කරන්න යන්න නොසන්ඩාල වැඩ ගැන හිත හිතා තමයි ගියේ. ඊට පස්සේ එයා වෙන ගෑණු ළමයෙකුගේ ඇඟේ වැදෙනවා. ඊට පස්සේ ඒ ගෑණු ළමයා “ඒ ඔයා කවුද මගේ ඇඟේ හැප්පෙන්න” කියලා එලාට කිව්වා. ඊට පස්සේ ඉතින් එලත් බලාගෙන ඉන්නැතුව අනිත් පැත්තට කිව්වා, “එහෙනම් ඉතින් ඔයා කවුද? මට ඔය විදිහට බනින්න” කියලා ඉතින් මේ විදිහට දෙන්නම බැනගෙන ගියා.

හැබැයි මේ රණ්ඩුව ගොඩක් වෙලා කරගන්න පුළුවන් වුණේ නෑ. ඒ මොකද කියල කියනවනම් දවල් කෑමට ගහන බෙල් එක ගහපු නිසා. හැබැයි මෙතනදි කාටවත් තේරුණේ නැති එක දෙයක් තමයි මේ ගෑණු ළමයි දෙන්නගෙම පෙනුම එක වගේ කියන එක. ඔන්න ඉතින් කොහොම හරි දවල් කෑම අරගෙන ඉවර උනහම හැමෝම එක එක ක්‍රියාකාරකම් වලට ගියා. ඒ අතරේ කඩු සටනුත් තිබුණා. කඩු සටන් වලට බෙලයි එලයි දෙන්නම දන්නෙ නැතුව ගියා. ඔන්න හිතපු විදිහටම ඉතිං අවසානයට බෙලාටයි එලාටයි වුනේ එකිනෙකා එක්ක සටන් කරන්න. ඔන්න දැන් දෙන්නම එක විදිහටම දක්ෂයි.



අවසානයේදී තියුණු උණුසුම් සටනකින් පස්සේ එලා තරඟය ජයග්‍රහණය කරනවා. ඔන්න ඊට පස්සේ දෙන්නම ඔලුවෙ තියෙන ආවරණ දෙක ගැලවුවට පස්සේ බෙලා හරිම ආචාරශීලි විදිහට “හායි මගේ නම බෙලා ඔයාව නේද මට අද උදේ හම්බුනේ? හඳුනගන්න ලැබීම සතුටක් ඔයාගේ නම මොකක්ද?” කියලා ඇහුවා. ඊළඟට එලා කැරකිලා අර ගලවපු ආවරණය පොළවේ ගහලා ‘එලා..’ කියලා එතනින් ගියා. ඔන්න එලා නම් කිසිම තරඟයකට සහභාගි වුණේ නෑ. හැබැයි එයාට බෙලාගෙන් පලිගන්න හොඳ සැලැස්මක් හැදුවා. බෙලා ඊළඟට එකතු වුණේ බාස්කට් බෝල් තරගයකට. ඔන්න ඒ තරඟය අතර මැදදී එලා එයාගේ සැලසුම ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඔන්න එලා කරපු දේ තමයි බෙලාගේ ටවල් එකට නිල් පාට තීන්ත දාපු එක.

ඔන්න එලා හිතපු විදිහටම බෙලා තරඟය මැදදි දාඩිය පිහිද ගන්න කියලා ටවල් එකෙන් මූණ පිහද ගත්තා. ඊට පස්සේ බෙලාගෙ මූණ සම්පූර්ණයෙන්ම නිල්පාට වුණා. මේක දැකලා හැමෝම බෙලාට හිනාවෙන්න පටන් ගත්තා. ඒ අස්සෙ එලා හැමෝටම වඩා හයියෙන් පැත්තකට වෙලා හිනා වෙන්න පටන් ගත්තා. මේක දැකපු බෙලා එලාට පාඩමක් උගන්නන්න ඕනි කියලා හිතාගෙන එදා රෑ ගිනිමලේ වටේ හැමෝම ඉඳගන්න නිසා බෙලා, එලා ඉඳගන්න හිටපු දර කොටයට ගම් ගෑවා. ඊළඟට එදා රෑ හැමෝම ගිනිමැලය වටේ ඉඳගත්තා. එලත් එයා වාඩි වෙන්න නියමිත දර කොටය උඩ වාඩිවුණා.



හැමෝම නිදාගන්න නැගිටලා යනකොට එලාට විතරක් නැගිට ගන්න බැරි වුණා. ඊළඟට අන්තිමට පැය දෙකක් විතර වෛද්‍යවරු දෙතුන් දෙනෙක් හොඳටම දඟලලා තමයි එලාව බේරගත්තේ. ඔන්න ඊට පස්සේ බෙලාගේ මූණේ කපටි හිනාවක් තිබුණා. මේක එලා හොඳටම දැක්කා, ඊට පහුවදා උදේ එලා බෙලාට පොඩි සාකච්ඡාවකට අඬගහනවා. එතනදි එලා කියනවා "බෙලා අහන්න දැන් අපි දෙන්නම සම සමයි. තව එක දෙයක් අපිට කරන්න තියෙන්නේ, අද අපි දෙන්නා කාර් තරඟයක් තියෙනවා. පරදින කෙනා රෑට කෑම්ප් එක ගාව තියෙන විලට පනින්න ඕනේ. " දෙන්නම ඒකට එකඟ වෙලා කාඩ් සෙල්ලම් කරන්න පටන් ගත්තා. ඊට පස්සේ අවසාන වතාවට එලා තරඟය පැරදුනා. ඊට පස්සේ එදා රෑ එලා විලට පැන්නා. ඒ අතරතුරේදී බෙලා එලාගේ ඇඳුම් ටික හොරකම් කරා. හැබැයි බෙලාට ඔය විදිහට ගොඩ දවසක් කරගෙන යන්න පුළුවන් වුණේ නෑ, ඒක වෙන ගෑණු ළමයෙකුට ඇහුණා.

ඊට පස්සේ එයා ටක් ගාලා ගිහින් ඒක එලාට කිව්වා. ඊට පස්සේ ඉතින් අවසානෙට බෙලා ඇඳුම් ටික දුන්නා. ඇඳුම් ඇඳ ගත්ත ගමන්ම බෙලයි එලයි දෙන්න එතන ගහගන්න පටන් ගත්තා. ඊට පස්සේ කෑම්ප් එක බාර ගුරුතුමිය මෙතනට ඇවිල්ලා මෙහෙම කිව්වා. "එලයි බෙලායි දැන් හොඳටම වැඩියි... ඔගොල්ලෝ ආයේ පාඩමක් ඉගෙන ගන්නකම්ම එකට ටෙන්ට් එකේ තමයි ඉන්න වෙන්නේ.. " මේක අහපු ගමන්ම එලාටයි බෙලාටයි දෙන්නටම එකටම "මොකක්...?" කියලා කියවුනා. ඊට පස්සේ එලා කිව්වා "මට නම් බෑ මේ යක්ෂණියත් එක්ක ඉන්න" ඊට පස්සේ අනිත් පැත්තට බෙලත් කිව්වා "ඇයි? මට පුළුවන් කියලද හිතාගෙන ඉන්නේ ඔයත් එක්ක ඉන්න" කියලා. ඊට පස්සේ ගුරුතුමිය "නෑ.. බෑ.. කියලා නෑ.. ඔය දෙන්නම අද රෑ කොහොමත් එකට තමයි නිදාගන්නේ. යන්න මගේ තරහ අවුස්ස ගන්නැතුව" කියල කිව්වා. ඊළඟට බෙලයි එලයි දෙන්නම එකම ටෙන්ට් එකේ නිදාගන්න පටන් ගත්තා.



නිදාගන්න කලින් එලා ෆොටෝ එකක් දිහා බල බලා හිටියා. ඒක දැකලා බෙලා ඇහුවා “මේ මොකක්ද? ඔයා මේ මොකක් දිහාද බලාගෙන ඉන්නේ බෙලා” කියලා. ඊට පස්සේ එයා කිව්වා “ මේක ඇවිල්ල මගේ  තාත්තගෙ ෆොටෝ එකක් කියලා තමයි අම්මා නං කිව්වේ. මං හිතන්නේ ඒක ඇත්ත වෙන්න ඇති. මේ ඒගොල්ලො දික්කසාද වෙන්න කලින් ගත්ත එකක්” කියලා එලා උත්තර දුන්නා. ඊට පස්සේ බෙලා “කෝ දෙන්න බලන්න මටත් පොඩ්ඩක් පෙන්නන්නකෝ” කියල කිව්වා. ඊළඟට ඒ දෙන්න ටෝච් එකක් ගහලා ෆොටෝ එක බැලුවා.




ඒක දැක්ක ගමන් බෙලා උඩ ගියා. ඊළඟට එලා ඇහුවා “ඇයි මොකක්ද උනේ” කියලා. ඊළඟට එලා ගැහෙන ගමන් කිව්වා, “මේ මේ මගේ තාත්තා” කියලා. “ඒක කොහොමද වෙන්නේ? ඔයාගේ තාත්තයි මගේ තාත්තයි දෙන්නම එක්කෙනෙක් වෙන්නේ කොහොමද?”  කියලා එලා ඇහුවා. ඊළඟට බෙලා “පොඩ්ඩක් ඉන්න මං ගාවත් ඔය වගේම ෆොටෝ එකක් තියෙනවා” කියලා කිව්වා. ඊළඟට බෙලා එයාගේ බඩු ගොඩ ඔක්කොම ඇදලා ෆොටෝ එකක් හොයාගත්තා. ඒ ෆොටෝ එකේ හිටියේ එලාගේ අම්මා. ඊට පස්සේ එලත් ගැහෙන ගමන්ම “මේ මේ මගේ අම්මා” කියලා කිව්වා.

ඊළඟට බෙලා “හෝ.. පොඩ්ඩක් ඉන්න ඔයාගේ ෆොටෝ එක දෙන්නකෝ.. ”  කියලා ඊළඟට එලත් එයාගේ ෆොටෝ එක දුන්නා. ඊළඟට බෙලා එලා ගාව තිබ්බ ෆොටෝ එකයි එයා ගාව තිබ්බ ෆොටෝ එකයි එකතු කරා. ඒක ඇත්තටම ෆොටෝ දෙකක් නෙමෙයි, එකම ෆොටෝ එකක කෑලි දෙකක්. ඊළඟට දෙන්නට දෙන්නා එකිනෙකාගේ මූණු බලා ගත්තා, එතකොට

තමයි දෙන්නටම තේරුනේ ඒ දෙන්නම එක වගේ කියලා. ඊළඟට ඒ දෙන්නට එකටම කියවුනා “මොනවා අපි නිවුන්නු.. ” කියලා.

ඔන්න ඉතින් එදායින් පස්සේ මේ දෙන්නා කැම්ප් එකේදි ගහ මරාගන්න වැඩ ටික පොඩ්ඩක් පැත්තකින් තියලා සහෝදරියන් වගේ සතුටින් හිටියා. ඒ අතරතුරේදී මේගොල්ල ආපහු එයාලගේ අම්මවයි තාත්තයි එකතු කරන්න ඕන නිසා හොඳ සැලැස්මක් හැදුවා. ඒ සැලැස්ම වුණේ බෙලා එයාලගේ අම්මත් එක්කත්, එලා එයාලගේ තාත්තත් එක්කත් යන එක. ඒ කියන්නේ ගෙවල් දෙකට මාරු වෙලා යන එක. ඊළඟට කොහොම හරි දෙන්නාම එකම තැනකදී එකතු කරවලා සතුටින් ඉන්න එක. හැබැයි මේක කරන්න හිතන තරම්ම ලේසි නෑ. ඊට පස්සේ දෙන්නම ෆොටෝ එකේ කෑලි දෙක එකතු කරල හොඳට බැලුවා. ඒ ෆොටෝ එක අරන් තියෙන නැව මොකක්ද කියලා. ඒ දෙන්න හිත හිතා ඉන්නකොට එලා දැක්කා ෆොටෝ එක යට ගහලා තියෙනවා ‘ගේල් නෞකාව 1987’ කියලා. ඊට පස්සේ බෙලාට හොඳ අදහසක් ආවා.




බෙලා කියනවා “අපි මේ නෞකාව ගැන තව පොඩ්ඩක් හොයමු, මේක දැන් කොහෙද දන්නෑ තියෙන්නේ? අපි නැවතත් අම්මවයි තාත්තයි දෙන්නව මේ නෞකාවට ගෙන්නලා මුණ ගස්වමු” කියලා. ඊළඟට බෙලා කියනවා “ඔයාගෙයි අම්මගෙයි අතර මොකක් හරි ඔය දෙන්නා විතරක් දන්න රහස් තියෙනවද? මට ඒවා කියන්න නැත්නම් කොහොමත් වැඩේ අහුවෙනවා” කියලා. ඊට පස්සේ එලා කියනවා “වැඩි රහසක් නෑ. මම කරපු දඟ වැඩ නං තියෙනවා. ඔයා පුළුවන් තරම් එතනට ගිහිල්ලා හොඳට හැසිරෙන්න බලන්න එතකොට අම්මගේ හිත පැහැදිලා ඔයා යන්න ඕනි කියන ඕනම තැනකට එක්ක යයි. තව මේ පාර වාර අවසාන විභාගයටත් A එකක් ගන්න බලන්න, එතකොට හරි.” ඊට පස්සේ බෙලා කිව්වා “ආ.. හරි හැබැයි මමයි, මම බලා ගන්න යන එක්කෙනයි ගාව රහස් මුර වචනයක් තියෙනවා. ඒක තමයි ‘බෙරා ඇම්සිටියා’ එයා හදිසියවත් ඒකෙ තේරුම ඇහුවොත් ඔයා කියන්න ඕනේ

‘සැබෑ මිත්‍රත්වය’ කියලා. ඒ මොකද කියනවනම් ලතින් භාෂාවෙන් සැබෑ මිත්‍රත්වයට කියන්නේ එහෙම තමයි. ”

ඊට පස්සේ බෙලත් එලාගේ ගෙදර ගිහින් හොඳට හැසිරෙන්න හිතා ගත්තා. එතකොට එලත් රහස් වචනය හොඳින් මතක තියා ගත්තා කොහොමහරි සමර් කෑම්ප් එක ඉවර වුණා. දෙන්නම සැලැස්ම ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. බෙලා එලාගේ අම්මත් එක්ක ගිහිල්ලා හරිම ආචාරශීලී විදිහට තමයි හැසිරුණේ. ඒ වගේම එලත් බෙලාගේ ගෙදර යන්න ගියාම එයාව ගන්න ආවේ ඒ දෙන්නගෙ තාත්තා නෙමෙයි. ඒ බෙලා බලාගන්න කෙනා. ඊට පස්සේ අර රහස් වචනය එලා හරිම අමාරුවෙන් කියලා ඒ මදිවට බෙලා වගේ හරිම ආචාරශීලී විදිහටත් හැසිරුණා. ඔන්න ඒ අතරේ බෙලා එයාගේ අම්මා වැඩ කරන තැනට ගියා. එතන ඇත්තටම කියනවනම් හරිම කම්මැලි තැනක්. එතන හිටපු එක ගෑණු කෙනෙක් හොට් චොක්ලට් එකක් බොන ගමන් කළු සුදු තිත් තියෙන ටීවී එකක් බල බලා හිටියා.

එතකොට තව කෙනෙක් එක එක උල් උල් තියෙන ගවුමක් මසමින් හිටියා. මේ මෙතන ඉන්නේ එලා වුනානම් මෙයා මෙතන අනිවාර්යෙන් ලොකු පිපිරීමක් කරලා දානවා. හැබැයි ඉතින් මෙතන ඉඳගෙන ඉන්න බෙලා නිසා එයා හරිම සංවර විදිහට පැත්තකට වෙලා පාඩුවේ ඉඳගෙන හිටියා. බෙලාගෙ මේ හරිම සංවර හැසිරීම දැකලා ඒ ඉන්නෙ එලා කියලා හිතාගෙන ඉන්න එයාගේ අම්මගේ ඇස්වල තිබුනෙ ලොකු පුදුමයක්. බෙලාට ඇහුනා එයාලගේ අම්මා කියනවා “බලන්න අර සමර් කෑම්ප් එකට ගියාම මගේ දුව කොච්චර වෙනස් වෙලාද කියලා”. මේක අහලා මේක ඇහිච්ච එලා වගේ ඉන්න බෙලාට නම් හොඳටම හිනා... ඔන්න දැන් එලා බෙලාගේ ගෙදරට ගියා. ඒක ඇත්තටම ගෙදරක් කියන්නත් බෑ. ඒක ලොකුම ලොකු බංගලාවක්, එයා ඒක වටේ තව ඇවිදිනකොට එයා දැක්කා මූනේ මේකප් ගාන්නැතුව මේකප් උලාගෙන ඉන්න ගෑණු කෙනෙක්.



එයා හිතාගෙන ඉන්නේ නම් එයා තරම් ලස්සන කෙනෙක් වෙන කොහෙවත් නෑ කියලා.. හැබැයි එයාගේ මූණ කවුරු හරි දැක්කනම් අනිවාර්යෙන්ම වමනෙට යනවා. ඒ තරමටම අප්පිරියයි ඊට පස්සේ එලා එතන හිටපු වැඩ කරන කෙනෙක්ගෙන් ඇහුවා “අර කවුද?” කියලා. ඊට පස්සේ එයා කිව්වා “මිස් ඔයාට මතක නැද්ද? මේ ඔයාගේ තාත්තා කසාද බඳින්න ඉන්න කෙනා නේ.. කියලා ඊළඟට එලාගේ ඇස් උඩ ගියා..

ඊළඟට එදා රෑ එලා ඉක්මණට බෙලාට කෝල් කරලා මේක ගැන කිව්වා. ඊට පස්සේ බෙලා කිව්වා “කමක් නෑ.. එයාව ගණන් ගන්නේ නැතුව ඉන්න අම්මයි තාත්තයි ආපහු එකතු උනහම අපි මෙයාගෙන් වැඩක් නෑ”.. කියලා. ඊට පස්සෙ ඉතින් ටික දවසක් ඔහොම ගෙවෙනවා. ඒ අතරතුරේදී බෙලා එලා විදිහට ඉන්න අතරෙදි වාර විභාගය හැම විෂයකටම A එකක් ගන්නවා. ඒක නිසා ඒකට තෑග්ගක් විදිහට එයාට ඕන දෙයක් ඉල්ලන්න පුළුවන් කියලා එයාලගේ අම්මා කිව්වා.

ඔන්න මේ සුභ ආරංචියත් එක්කම එලත් සුභ ආරංචියක් ගෙනාවා. ඒක තමයි අර ඒංගොල්ලො බලපු නැව තව දවස් තුනකින් වරායට එනවා කියන එක. ඒවගේම ඒක මගීන්ටත් විවෘතයි කියන  නිසා බෙලා අම්මගෙන් තෑග්ග විදිහට ඉල්ලුවේ වරායට ගිහින් අර නැව බලන එකයි. ඊට පස්සේ  එලත් තාත්තට කියලා නැව බලන්න යන්න ලෑස්ති වුණා. ඊට පස්සේ තාත්තා කියනවා “හරි එලා අපිත් එක්ක ඇමන්ඩත් එනවා.” ඊට පස්සේ එලාට එකපාරටම කියවුනා “කවුද..” කියලා. ඊට පස්සේ එයාගේ තාත්තා කිව්වා “ඇමැන්ඩා ඔයාගේ අනාගත අම්මා” කියලා. ඊට පස්සේ තමයි එලාට තරු පෙනුනේ, ඊට පස්සේ එලා කෑගහලා කිව්වා “අයියෝ.. තාත්තේ මට මේ ගමන යන්න ඕනි ඔයත් එක්ක විතරයි.. ” කියලා. ඒක හින්ද අවසානයට ගොඩක් දඟලලා දඟලලා තාත්තව කැමති කරගන්න එලාට පුළුවන් වුණා.



ඔන්න මාස ගානක් හිතපු දවස ආවා. එදා රෑ බෙලා අම්මවත් එලා තාත්තවත් එක්කගෙන නැවට ආවා. ඊළඟට අම්මවයි තාත්තවයි දෙන්නවම හරිම අමාරුවෙන් එකම තැනක ඉන්දවලා ඒ දෙන්නට නිදහසේ කතා කරන්න දුන්නා. ටික වෙලාවකින් බලනකොට දෙන්නම හිනා වෙවී කතා කරනවා. ඒ කියන්නේ ප්‍රශ්න විසඳලාද?.. ඔන්න ටික වෙලාවක පොඩි නිශ්ශබ්දතාවයක් මැදදී එලයි බෙලයි දෙන්නා කියනවා "අම්මේ මේ අහන්න අපි දෙන්න ඇත්තටම නිවුන්නු කියලා හොයාගත්තා. එතකොට තාත්තේ මෙච්චර දවස් ඔයත් එක්ක හිටියේ බෙලා නෙමෙයි එලා.. අම්මා එතකොට ඔයත් එක්ක මෙච්චර දවස් හිටියේ එලා නෙමෙයි බෙලා. හරි.. කොහොම හරි අපි හැමෝම දැන් එක තැනකදි හම්බ වුණ නිසා අපි හොඳ ට්‍රිප් එකක් යමු නේද.. වෙන කොහෙටවත් නෙමෙයි අපි යන්නේ කැම්පින් වලට".




ඊළඟට දහලල යාන්තම් අම්මවයි තාත්තවයි කැමති කරගන්න කපටි නිවුන්නු දෙන්නට පුළුවන් වුණා. ඊට පස්සේ ඒගොල්ලෝ හරි විදියටම ගෙවල් වලට ගියා. ඒ කියන්නේ බෙලා තාත්තා ගාවටයි එලා අම්මා ගාවටයි. ට්‍රිප් එක යන දවස දවසින් දවස ළං වුණා. ට්‍රිප් එක යන්න කලින් දවස වෙනකම්ම හැමෝගෙම හිතේ ඒ කිච්චේ බෙලාගේ සහ එලාගෙ හිතේ ලොකු සතුටක් තිබුණා. හැබැයි ඒ ඇමන්ඩත් ට්‍රිප් එක යන්න එනවා කියලා දැන ගන්නකල් විතරයි. ඊට පස්සේ ඉතින් අවසානෙදි දුකින් වුනත් එයාලට මේ පවුල ට්‍රිප් එකට මේ වධක භාර්යාවත් එක්කන් යන්න වුණා.

ඊළඟට ට්‍රිප් එක යනකම්ම ඒ කියන්නේ කෑම්පින් කරන කාලයට ළඟා වෙනකම්ම කපටි නිවුන්නු දෙන්නා ඇමෙන්ඩට හොඳ පාඩමක් උගන්වන්න සැලසුම් කරන ගමන් තමයි තිබුණේ.

ඔන්න ට්‍රිප් එක ගිහිල්ලා ඒගොල්ලෝ හොඳට විනෝද වුණා. හැබැයි මේ විනෝදය දැම්ම නෙමෙයි පටන් ගන්නේ තව චූට්ටකින් තමයි පටන් ගන්නේ. ඒ කියන්නේ හැමෝම ගිනි මැලේ වටේ ඉන්නකොට ඇමන්ඩා ළඟ එහා පැත්තේ හිටපු බෙලා හොරෙන් ඇමන්ඩගේ ගවුමට ගිනි තියෙනවා. ඊළඟට එයාට වෙන්නේ කෑගහගහා කෑම්ප් එක වටේම දුවන්න.  මේක බලපු එකෙන් නිවුන්ණු දෙන්නට ආයෙ රෑට කන්න ඕනේ නෑ. ඒ කියන්නේ ඒ දෙන්නට ඒ තරම්ම සතුටුයි. හැබැයි එයාලගේ සැලසුම මෙතනින් ඉවර නෑ.. ඒගොල්ලෝ එදා රෑ එමෙන්ම නිදාගෙන හිටපු ස්ලීපින් බෑග් එකත් එක්කම ළඟ තිබ්බ විලට දැම්මා. එදා උදේ නැගිට්ටිනකොට ඇමැන්ඩා විල මැදටම ගිහිල්ලා අන්තිමට එයා අමාරුවෙන් ගොඩට ආවහම තාත්තට බැනගෙන කෑගහගෙන එතනින් දිව්වා. මේක දැකලා නිවුණු දෙන්නගෙ සැලැස්ම සාර්ථක වුනා.  එකේ සතුට ඒ දෙන්න සැමරුවා. හැබැයි ඉතින් මේ සතුටත් ගොඩක් වෙලා තිබුනෙ නෑ.. එයාලට ඇහුණා අම්මයි තාත්තයි දෙන්නා කතා වෙනවා එයාලගේ අම්මා එලාවත් ඇරගෙන වෙන රටකට යනවාලු.. ඒ නිසා හෙට උදේට බෙලයි එයාගේ තාත්තටයි එලාටයි අම්මටයි  සමුදෙන්න එනවලු. මේක ඇහිච්ච අපේ නිවුන්නු දෙන්නට තව දුක හිතුනා හැබැයි මේකටවත් ඒගොල්ලෝ පසුබට උනේ නම් නෑ. බලමුකො මේ පාර නිවුන්ණු දෙන්නගේ සැලසුම මොන වගේ වෙයිද කියලා.



ඔන්න කොහොමෙන් කොහොමහරි ඊළඟ දවසේ උදෙත් උදාවුනා. නිවුන්ණු දෙන්නම එකම වගේ ඇඳලා එක විදිහටම කොන්ඩේ පීරලා හරියටම එකම කෙනා වගේමයි ඊට පස්සේ හැමෝම එයාපෝට් එකට ගියාම එලාගේ අම්මගේ ෆ්ලයිට් එක ආවා. ඊළඟට එලාගේ අම්මා යන්න යනකොට නිවුන්ණු දෙන්න කියනවා "අපි දෙන්නා කවුද කියලා කියන්නේ නෑ.. ඔගොල්ලෝ ආපහු එකට හිටියේ නැත්නම්".. ඊළඟට තාත්තට තරහ ගිහිල්ලා "දැන්මම කියනවද? නැද්ද? " කියලා අහනවා. ඊළඟට නිවුන්ණු දෙන්නම එක පාර හරිම සැරෙන් "නෑ.... " කියලා කියනවා. ඊට පස්සේ නිවුන්ණු දෙන්න පැහැදිලි කරලා දෙනවා. ඒ දෙන්නා අතර කොච්චර ශක්තිමත් බැඳීමක්ද තියෙන්නේ කියලා තව එයාලගේ අම්මයි තාත්තයි එකතු උනොත් ඒ දෙන්නට කොච්චර සතුටක් ලැබෙනවද කියලයි, ඒ වගේම පවුලක් විදිහට ඉන්න එකේ කොච්චර සතුටන් තියෙනවද කියලත් ඒගොල්ලො කිව්වා. පස්සේ ටිකක් වෙලා කල්පනා කරලා අම්මයි තාත්තයි දෙන්න එකඟ වුණා.

ටික කාලයකට පසු දැන් එලයි බෙලයි අම්මයි තාත්තයි එක පවුලක් විදිහට ජීවත් වෙනවා. ඒ වගේම ඔයාලට හිතාගන්න පුළුවන්ද කවුද එලාගෙයි බෙලාගෙයි ගෝඩ්මදර් නැත්නම් භාරකාරයා කියලා. ඒ වෙන කවුරුත් නෙමෙයි "ඇමැන්ඩා". කොහොමහරි අන්තිමට ඇමන්ඩා තේරුම් අරගෙන තියෙනවා. එයාගේ මහ ලොකු ලස්සනක් නෑ කියලා. ඊළඟට එයා කරපු හැම නපුරු වැඩකටම වගේ නිවුන්ණු දෙන්නගෙන් සමාව අරගෙන ඒ පවුලේ සාමාජිකයෙක් වෙනවා. ඒ වගේම අම්මගේ වැඩපලේ කළු සුදු තිත් ටීවි එකක් බල බලා හිටපු ගෑණු කෙනාට දැන් හොඳ එල් ඊ.ඩී ස්ක්‍රීන් එකක් තියෙන ටීවී එකක් තමයි තියෙන්නේ. ඒ වගේම අර කටු කටු ගවුම වසරේ ලස්සනම විලාසිතාව කියලා සම්මානයකුත් ඇරගෙන තියෙනවා.ඊට පස්සේ පවුලේ හැමදෙනාම සතුටින් සමගිව කාලය ගතකලා.


නිමි.




එලා සහ බෙලා ගේ මතකයන් බිදක්.........






උදව්......
අයියෝ......
මගේ ලස්සන ඇඳුම පිච්චෙනවා......


FASHION


Yum... Yum...



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරනය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වර්ෂයේ පටන් ගත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාගයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවාසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපගේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය හා අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට  විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාධිය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශණ.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-653-8